**තේ පර්යේෂණ මණ්ඩලය - 2019**
**---------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
---------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
---------------------------

තේ පර්යේෂණ මණ්ඩලයේ **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ සහ **1971** අංක **38** දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ **1.5** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ **2019** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------

මෙම වාර්තාවේ **1.5** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම
------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

## 1.4 විගණන විෂය පථය

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.**

**මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**

- **අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**

- **කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.**

- **සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.**

- **හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.**

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂ ගැලපීම්, බොල්ණය අඩිවෙන් කිරීම්, වෙළඳ හා වෙනත් ලැබීම් ණයහිමියෝ හා වෙනත් ගෙවිය යුතු ශේෂ හා උපචිත වියදම් යන ශේෂයන්ගේ විචලනයන්වල මුළු එකතුව වූ රු.1,815,863 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී 2018 වසරේ රු. 19,168 ක් සහ 2019 වසරේ රු. 20,674 ක් අතර වෙනස වැරදීමකින් රු. 15,000 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර ඇත. එම වරද 2019 වර්ෂයේ ඌනතාවය වූ රු. 151,170 ට ගැලපීම නිසා, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වසරේ ඌනතාවයට රු. 151,157 ක් ලෙස පෙන්වා ඇත. වෙළඳ හා වෙනත් ලැබීම් යටතේ උපචිත පොලී ආදායම් ලැබීම් සහ බොල්ණය අධි වෙන් කිරීම් ගැලපීම නිසා සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙළඳ හා වෙනත් ලැබීම් වෙනස් වීම රු. දහස් 1,403ක් ලෙස පෙන්වා ඇත. උපචිත වියදම් ගිණුම් තුළ විවිධ ණයහිමි ශේෂයන් හා ණය හිමි හා වෙනත් ගෙවිය යුතු වියදම් තුළ උපචිත වියදම් ශේෂ කිහිපයක් එකිනෙකට ගැලපීම මෙම වෙනසට හේතු වී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 අනුව කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2015 වර්ෂයේදී රු.1,500,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු බස්රථයක් 2017 වර්ෂයේදී විකුණා තිබුණද එම රථය නැවත ප්‍රත්‍යාගණනය කරන ලද රථයක් ලෙස 2018 වර්ෂයේදී ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු මෝටර් රථ හා ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විමසුමේ සඳහන් බස් රථය 2017 වර්ෂයේ දී විකුණා ඇති අතර ඊට අදාළ ගිණුම් සටහන් නිවැරදි ව එම වර්ෂයේ දී ගිණුම් ගත කර ඇත. නමුත් 2015 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල අගයන් 2018 වර්ෂයේ දී ගිණුම්ගත කිරීමට සිදු වීම නිසා 2015 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය වූ බස් රථය නැවත 2018 වර්ෂයේ දී ලෙජර් ගිණුම් වලට ඇතුළත් වී ඇත. එම වරද 2020 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අපහරණය කරන ලද වත්කමෙහි ප්‍රත්‍යාගණන වටිනාකම නැවත ගිණුම්ගත කිරීම නිවැරදි කළ යුතුය. |
| (ආ)මතුගම උපකාර්යාලය භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් කැබ් රථයක් රු.2,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද එම රථයෙහි අයිතිය තහවුරු කරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී මෙම රථයෙහි අලුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස දරා තිබුණු රු.990,050 ක් ප්‍රාග්ධනිත කර එම අගය මත රු.40,214 ක ක්ෂය ප්‍රතිපාදනයක්ද කර තිබුණි. | ඉහළ වටිනාකමකින් යුතු වාහන ප්‍රතිස්ථාපන වියදම් ප්‍රාග්ධන ගත කිරීමට කටයුතු කරන බැවින් 2015 වර්ෂයේ මෙම වාහනය වෙනුවෙන් දරන ලද ප්‍රතිස්ථාපන වියදම් ප්‍රාග්ධන ගත කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම මෙම වාහනය තේ පර්යේෂණ ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | වාහනය මණ්ඩලයට අයිති කර ගැනීම, එය ගිණුම්ගත කිරීම හා ප්‍රාග්ධනිත කළ අයහාර වියදම ඉවත් කිරීම සිදු කළ යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂයට අදාළ රු.8,700,272 ක්වූ පොලී ආදායම මත ගෙවිය යුතු රු.2,436,076 ක ආදායම් බදු මුදල වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු සම්බන්ධයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරියේ දී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වුවද මෙම පොලී ආදායම් මත දැනටමත් රඳවා ගැනීමේ බදු මුදල් ගෙවා ඇත. | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු මුදල ගිණුම්ගත කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ තලවකැලේ ශාන්ත කුම්බස් වතුයායේ හා එම කම්හලේ ස්ථාවර වත්කම් ක්ෂය රු.706,127 ක් මූල්‍ය | රු. 706,127ක් වූ ක්ෂය වීම් වලට අදාළ ව සිදු කළ යුතු ගැලපීම 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. Save the Children ව්‍යාපෘතිය නමින් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් වල දක්වා ඇති රු. | වර්ෂයට අදාළ ක්ෂය අඩුවෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණු අතර එම වතුයායේ **Save the Children** ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් ඉකුත් වර්ෂවල අවසන් කර තිබුණද, එහි පිරිවැය වූ රු.**1,583,587** ක මුදල ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | **1,583,587** සඳහා වවුචර් පත් වතු කාර්යාලයේ ඇති අතර එම වියදම් **2020** වසරේ දී වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගැලපීම් කිරීමත් නිමකරන ලද කොන්ත්‍රාත්තුවෙහි වැඩ වටිනාකම ඉංජිනේරුවරයාගේ සහතිකය මත ප්‍රාග්ධනිත කිරීමත් කළ යුතුය. |
| (ඉ) තේ සැකසුම් කිරීම සඳහා මණ්ඩලය විසින් **1982** වර්ෂයේදී රු.**4,142,173** ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාළ ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය නොවූ අතර භාවිතයට ගෙන නොතිබුණු අතර මෙම යන්ත්‍රවල වටිනාකම භාණ්ඩාගාර අනුමැතිය මත පොත්වලින් ලියාහරින ලෙස **2014** වර්ෂයේදී පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව මඟින් නියෝග කර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම යන්ත්‍රවල වටිනාකම කෙරීගෙනයන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | **2014** නොවැම්බර් මස **19** වන දින පැවති **COPE** කමිටු රැස්වීමේදී **1982** වර්ෂයේ රු.**4,142,173** ක් වැයකර ආනයනය කරනු ලදුව දැනට ප්‍රයෝජනයට නොගෙන පවතින යන්ත්‍රයේ වටිනාකම පොත් වලින් ලියාහැරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇතත් ඒ සඳහා අනුමැතිය මෙතෙක් ලැබී නොමැති අතර මෙම අගයන් ලියහැරීම සඳහා අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා නැවත ඒ සම්බන්ධව කටයුතු කරනු ලබන බව දන්වා සිටිමු. | පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නියෝගය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) වටිනාකම රු.**2,381,613** ක් ලෙස අස්පෘශ්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශාන්ත කුම්බ්ස් වතුයායේ අයි.එස් ඕ. ප්‍රමිත සහතිකය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම අස්පෘශ්‍ය වත්කම් වල **ISO** ප්‍රමිති සහතිකය සඳහා දරන ලද වියදම් විස්තරයන් වර්ෂ **15**කට අධික කාලයකට වඩා පැරණි බැවින් එම විස්තරයන් සොයා ගැනීමට නොහැකි වී ඇත. එම නිසා මෙය ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම්වල අයිතිය සනාථ කිරීමට අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයේ තලවකැලේ ශාන්ත කූම්බ්ස් වතුයායට, ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යන ආයතන වලින් රු.1,655,762 ක් 2012 වර්ෂයේ සිට ලැබිය යුතු ලෙස ගිණුම්ගතකර තිබුණද එම මුදල් අය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. එසේම ශාන්ත කූම්බ්ස් වතුයායේ අභ්‍යන්තර පාලන දුර්වලතා නිසා 2017 වර්ෂයේදි සිදුව තිබූ රු. 10,423,378 ක මූල්‍ය වංචාවක් ණයගැති ශේෂය තුළ පවතින නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය නිරවුල් කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යන ආයතනවලින්, ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස වතු අධිකාරීට උපදෙස් දී ඇත.<br>මූල්‍ය වංචාවෙන් අහිමි වූ මුදල අයකර ගැනීම සඳහා මූලික විමර්ශන පවත්වා ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කොට අවශ්‍ය කටයුතු එම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට සහ මූල්‍ය වංචාව සම්බන්ධ පරීක්ෂණ ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 571(3) | | | |
| | වර්ෂ 2 ඉක්මවූ රු.524,685 ක් වූ රඳවාගත් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | රඳවා ගත් මුදල් ඉදිරියේ දී නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ පාර්ශ්ව හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපානබව තහවුරු වන්නේ නම් ආදායමට බැර කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික පදනමට වුවත් මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර සහ අංශ ප්‍රධානී තනතුරු 04 ක් සඳහා වර්ෂ 3 සිට වර්ෂ 7 දක්වා නිත්‍ය පත්වීමක් සිදුනොකර තාවකාලික වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් කර සමාලෝචිත වර්ෂයේදී රු1,106,814 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර පිරවීම සඳහා අවස්ථා ගණනාවකදී පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවුවත් සුදුසුකම් සපුරාලූ අයදුම්කරුවන් ඉදිරිපත් නොවූ බැවින් නැවතත් 2020 සැප්තැම්බර් මස 22 දිනැති ලිපිය මඟින් ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුරට බඳවා ගැනීම සඳහා වැවිලි අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.<br>අංශ ප්‍රධානි තනතුරට බඳවා ගැනීම සඳහා අභ්‍යන්තර වශයෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර එහිදී සුදුසුකම්ලත් නිලධාරීන් දෙදෙනෙක් පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තෝරා ඇත. ඒ සඳහා වැවිලි අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා තේ පර්යේෂණ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බඳවා ගැනීම් කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු.78,598,00ක් කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2008 වර්ෂයේ සහ 2013 වර්ෂවල තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කෙටිකාලීන තැන්පතුවල ආයෝජනයන් සිදුකර තිබුණි. | මුදල් පනත හා චක්‍රලේඛය අනුව අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) 1957 අංක 51 දරන තේ පාලන පනතේ විධිවිධාන අනුව නිකුත් කරන ලද තේ කොමසාරිස්ගේ අංක TC/RT/CIR/2015/11 හා 2015 දෙසැම්බර් 23 දිනැති චක්‍රලේඛය | (i) චක්‍රලේඛය අනුව ක්ෂුද්‍ර ජීවීන් සහ තෙතමනයෙන් හානි නොවන පරිදි කසල තේ ඇසුරුම් තුළ බහා ගබඩා කිරීමත්, තෙතමන ප්‍රතිරෝධී බහාලුම් භාවිතා කිරීමත් කළයුතු වුවද ඊට පටහැනිව ඉතිරි වූ කසල තේ ශාන්ත කුම්බිස් තේ කම්හල් පරිශ්‍රයේ කෙලවරක බිම ගොඩ ගසා තිබුණි. | අදාළ චක්‍රලේඛයන්ට අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) කසල තේ තොග අපහරණය කිරීමේදී පළමුවෙන් නිපදවෙන කසල තේ පළමුවෙන් නිකුත් කිරීම සඳහා වන **FIFO** ක්‍රමය අනුගමනය කිරීමට පහසුවන අයුරින් නිෂ්පාදිත දිනයන් අනුව කසල තේ ගබඩා කළ යුතු වුවද ශාන්ත කුම්බිස් තේ කර්මාන්තශාලාවේ කසල තේ තොග මෙම නියමයන්ට පටහැනිව අක්‍රමවත්ව ගොඩ ගසා තිබුණි. | අදාළ චක්‍රලේඛයන්ට අනුව ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

---------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.152,304,330 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.63,542,018 ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.88,762,312 ක ඌනතාවයේ වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 140 ක් විය. ශාන්ත කූම්බ්ස් වතුයායයේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 200 ක ඌනතාවයක් පැවතීම හා ශාන්ත ජෝකිම් වතුයායේ සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 54 ක ඌනතාවයක් පැවතීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

3.1 අනාර්ථික ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශේෂ ව්‍යාපෘති යටතේ පර්යේෂණ කටයුතු සඳහා රු.14,030,854 ක් වැයකර 2017 වර්ෂයේදී ඉන්දියාවෙන් ආනයනය කළ Walk in Type Environmental Facility නමැති උපකරණය වසර දෙකක් ගතවී තිබුණද, එම උපකරණය ස්ථාපනය, පැවරීම සහ ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමට නොපැවතීම මත පර්යේෂණ සඳහා භාවිතාකළ නොහැකිව පැවතුණි. | උපකරණය මිලදීගත් ආයතනයට ස්ථාපනය හා පැවරීම නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම නිසා එම ආයතනය සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා එක්ව තේ පර්යේෂණ මණ්ඩලය නීතිමය ක්‍රියාමාර්ගයකට එළඹ ඇත. | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර අලාභ අයකර ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)තේ පර්යේෂණ මණ්ඩලයට අයත් වාහන 5 ක් සඳහා වාහන ලියාපදිංචි මුල්පිටපත් නොමැති බව නිරීක්ෂණය විය. ඉන් වාහන 3 ක් මණ්ඩලයේ ගරාජය වෙත යොමුකර තිබුණද වසර 2 කට අධික කාලයක සිට අලුත්වැඩියා කටයුතු නිමකර නොතිබීම හේතුවෙන් ඒවා ධාවනයට යොදවා ගැනීමට නොහැකිව පැවතුණි. | වාහන අංකය — ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත පවතීද නොපවතීද යන්න<br>32 Sri 1806 — නොපවතී<br>32 Sri 3467 — නොපවතී<br>32 Sri 5991 — නොපවතී<br>253-1215 — නොපවතී<br>72 Sri 7900 — නොපවතී | මෝටර් රථ වාහන දෙපාර්තමේන්තු වෙන් විමසා ලියාපදිංචි සහතික ලබාගත යුතුය. නිෂ්කාර්යයව පවතින වාහන ධාවන තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)වලහන්දූව, දෙනියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාලවල රු.72,031,804 ක් වැය කර ගොඩනැගිලි ඉදිකර තිබුණද ඉඩම්වල අයිතිය රජයෙන් හෝ අදාළ රාජ්‍ය ආයතනවලින් මණ්ඩලය වෙත පවරා ගැනීමට විගණිත දින දක්වාම කටයුතු කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් වාහන 10 ක් රු.11,232,000 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණද තේ පර්යේෂණ මණ්ඩලය වෙත ඒවායේ අයිතිය පවරාගෙන නොතිබුණි. | දෙනියාය ඉඩම තලවකැලේ වතු සමාගම සතු වන අතර අයිතිය සඳහා ඉල්ලුම් කර ඇත. කොට්ටව ඉඩම සඳහා වසර 30 ක දීර්ඝ කාලීන බදු ඔප්පුවක් ලබා දීම සඳහා අවශ්‍ය සියලු ලිපි ලේඛන කටයුතු යක්කළමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කර ඇත. ඉන් අනතුරුව සියලු ලිපි ලේඛන දකුණු පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයට යොමු කිරීමට නියමිත ව ඇත. තවද වලහන්දූව __ඉඩම රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වන අතර අයිතිය පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලය නමට අයත් වාහන තේ පර්යේෂණ ආයතනය නමට පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | මූලා‍ය ප්‍රකාශනවල සටහන් කරන ලද ඉඩම් සහ වාහන අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේදී තලවකැලේ ශාන්ත කූම්බ්ස් වතුයායේ දළු නෙලීම සඳහා යොදවා තිබූ ශ්‍රමික දින ගණන 50,155 ක් වුවද ඊට වඩා වැඩි දින ගණනක් එනම් ශ්‍රමික දින 58,116 ක් පොහොර යෙදීම, කෘමිනාශක යෙදීම හා කප්පාදු කිරීම, වල් නෙලීම වැනි විවිධ | ශාන්ත කූම්බ්ස් වතුයායේ හිටපු වතු අධිකාරීවරයාට විරුද්ධව විනය පරීක්ෂණයක් සහ මූලික අයිතිවාසිකම් නඩුවක් පැවති හෙයින් 2018 වසරේ සැප්තැම්බර් මස සිට මේ දක්වා පූර්ණ කාලීන වතු අධිකාරීවරයෙකු බඳවා ගැනීමට නොහැකි වූ අතර ඒ සඳහා තේ පර්යේෂණ ආයතනයට අයත් ශාන්ත ජෝකීම් වතුයායේ පූර්ණ කාලීන වතු අධිකාරීවරයා ශාන්ත කූම්බ්ස් වත්තේ වැඩ ආවරණය කිරීමට තාවකාලික ව පත් කරන ලදී. එම නිසා එම වතු | නිසි අධීක්ෂණයක් මත පිරිවැය කළමණාකරණය කර කාර්යසාධනය ඉහළ නංවා ගත යුතුය. |

| | | |
|---|---|---|
| කාර්යයන්ට යොදවා තිබුණි. ශ්‍රමිකයන් අදාළ කාර්යයන් සඳහා නිසි අධීක්ෂණයක් මත යොදවා නොතිබුණු බැවින් පිරිවැය කළමනාකරණය දුර්වල තත්ත්වයක පැවතුණි. ඒ හේතුවෙන් ඉකුත් වර්ෂයේ රු.29,444,834 ක අතිරික්තයක් පෙන්නුම් කළ මෙම වතුයාය සමාලෝචිත වර්ෂයේදී රු.29,548,466 ක ඌනතාවයක් වාර්තා කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට සාපේක්ෂව සියයට 200 ක පිරිහීමක් විය. | අධිකාරීවරයා සතියකට දින කිහිපයක් පමණක් ශාන්ත කුම්බිස් වත්තේ වැඩ ආවරණය කිරීම නිසා තේ දළු නෙලීම හා අනෙකුත් විවිධ කාර්යයන් පූර්ණ අධීක්ෂණයක් යටතේ කාර්යක්ෂම ව සිදු කිරීමට නොහැකි විය. 2019 අගෝස්තු මස නව සහකාර වතු අධිකාරීවරයෙකු බඳවා ගන්නා ලද අතර හිටපු වතු අධිකාරීවරයාට එරෙහිව පැවති විනය පරීක්ෂණය සහ නඩු කටයුත්ත අවසන් වී ඔහු සේවයෙන් පහකොට ඇත. නව පූර්ණ කාලීන වතු අධිකාරීවරයෙකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | |
| (ආ)සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට අයත් රත්නපුර ශාන්ත ජෝකිම් කර්මාන්තශාලාවේ වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය තේ කිලෝග්‍රෑම් 1,020,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය සියයට 72 ක ඌන ධාරිතාවයකින් යුතුව ක්‍රියාත්මකව පැවති බව නිරීක්ෂණය විය. එය තේ කිලෝවක් මත අන්තර්ගත ස්ථාවර පිරිවැය ඉහළයාමටත් නිමි තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය ඉහළ යාමටත් හේතු වී තිබුණි. | ශාන්ත ජෝකීම් පාලනාධිකාරියේ පාලනයට යටත් නොවන සාධක නිසා පෙර වර්ෂ වලට සාපේක්ෂව සමාලෝචිත වසරේ දී වතුයාය අලාභ වී ඇත. 2018 වසරට සාපේක්ෂ ව 2019 වසරේ දී ක්ෂය වීම් රු.536,586කින් වැඩි වීම හා කම්කරු වැටුප් වැඩි වීම නිෂ්පාදන පිරිවැය වැඩි වීමට හේතුවී ඇත. තවද ශාන්ත ජෝකීම් වත්තේ පවතින කාරක ප්‍රාග්ධන හිඟය, කර්මාන්තශාලාවේ පවතින යන්ත්‍රෝපකරණවල දුර්වලතා හේතු කොටගෙන ඌන ධාරිතාවයෙන් කර්මාන්තශාලාව ක්‍රියාත්මක කිරීමට සිදු වී තිබේ. | කර්මාන්තශාලාවේ පවතින නිෂ්පාදන ධාරිතාවය උපයෝජනය කර නිෂ්පාදන පිරිවැය අවම කරගත යුතුය. |

**3.4 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්නපුර ශාන්ත ජෝකීම් වතුයායට අයත් සමස්ත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 141.98 ක් වූ අතර ඉන් තේ වගාව සහ මව් වගාව සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 53.99 ක් වුවද එයින් හෙක්ටයාර් 32.79 ක භූමි ප්‍රමාණයක් නැවත තේ වගා නොකර පවතින බව නිරීක්ෂණය වූ අතර වතුයායේ හෙක්ටයාර් 8.74 ක පැතිර | දැනට පවතින වගාවන් පැරණි තේ වගාවන් වන අතර තේ ගස් මැරියාම හේතු කොටගෙන තේ දළු ආදායම් ලබාගත හැකි තේ වගාව විහිදී ඇති බිම් ප්‍රමාණය අඩු වී ඇත. කෙසේවුවද ප්‍රාග්ධන ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් නැවත වගා කටයුතු වසර ගණනාවකින් සිදු කිරීමට නොහැකි වී ඇත.<br>2003 වසරින් පසුව අඳ ගොවියන් විසින් වතුයායට ලබා දිය යුතු අඳ කොටස ලබා දී නොමැති අතර මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගැන ගොවිජන සේවා | වතුයායට අයත් නිෂ්කාර්යයව පවතින ඉඩම් භාවිතයට ගැනීමට සහ ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| පැවතුණ කුඹුරු සහිත ඉඩම් අද ගොවීන් වෙත පවරා තිබුණද එම කුඹුරු මඟින් ලැබිය යුතු ආදායම් කොටස වර්ෂ ගණනාවක සිට මණ්ඩලයට ලබාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතී. |